# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
# காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
# LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகத்த மெதுர", காணிச் செயலகம், 1200/6, இரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretriat,1200/6, Rajamalwatta Road, Battaramulla.

☎ 011 279 7400
Fax 011 286 4051


මගේ අංකය / எனது இல / My No. LAND/ප්‍රගතිය/ර.අව.කැලෑ/කළ/2021 ඔබේ අංකය / உமது இல / Your No

දිනය / திகதி / Date 2021.05.17

සියළුම ප්‍රාදේශීය ලේකම්වරු,

<u>වන සංරක්ෂක ජනරාල් වෙත කළමනාකරණය පැවරී තිබූ ඉඩම් හඳුනාගෙන ප්‍රාදේශීය ලේකම් භාරයට ගැනීම</u>

උක්ත කරණය සම්බන්ධයෙන් මා විසින් නිකුත් කරන ලද 2020/18 හා 2020.11.10 දිනැති චක්‍රලේඛය හා 2020/05 හා 2020.12.02 දිනැති උපදෙස් පත්‍රිකාව හා බැඳේ.

02. ඒ අනුව, වන සංරක්ෂණ ජනරාල් වෙත පැවරී තිබූ ඉඩම්වලින් කැලෑ නොමැති හෝ ලඳු කැලෑ සහිත ඉඩම් හඳුනාගැනීම හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සංක්ෂිප්ත වාර්තා සකස් කිරීම 2021.03.31 දින වන විට සිදුකර අවසන් කල යුතුව ඇති අතර මා විසින් මේ සම්බන්ධයෙන් ඔබව අවස්ථා ගණනාවකදී දැනුවත් කර ඇත. එබැවින් මේ වන විට ඔබ විසින් එම ලේඛණ සකස් කර අවසන් කර එසේ හඳුනාගත් ඉඩම් ඔබගේ භාරයට ගෙන ඇතැයි විශ්වාස කරමි.

03. ජාතික අවශ්‍යතාවයන්ට ප්‍රමුඛතාවය ලබාදෙමින් දේශීය ආහාර බෝග හා සත්ව ආහාර නිෂ්පාදනයන්, අපනයන අභිමුඛ කර්මාන්ත හා ආනයන ආදේශ කර්මාන්ත ස්ථාපිත කිරීමත්, දේශීය හා විදේශ ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය කිරීමත් සඳහා සුදුසු රජයේ ඉඩම් හඳුනාගෙන, ප්‍රශස්ත ලෙස කළමනාකරණය කිරීම වැදගත් වේ. එම අරමුණ සඳහා සුදුසු රජයේ ඉඩම් කාර්යක්ෂමව හා ඵලදායීව යොදවාගැනීම උදෙසා මෙම ඉඩම් හඳුනාගෙන ඔබගේ භාරයට ගැනීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රමුඛ අවධානය යොමුව ඇති බව සඳහන් කරමි.

I. ඒ අනුව ඔබ විසින් හඳුනාගෙන ඔබගේ භාරයට පවරාගනු ලැබූ ඉඩම් පිළිබඳව මෙහි ඇමුණුම 01 ආකෘතිය ප්‍රකාරව මැයි 31 දිනට ප්‍රථම මා වෙත වාර්තා කරන්න.

II. වන සංරක්ෂක ජනරාල් දෙපාර්තමේන්තුව විසින් මේ වන විට නිදහස් කළ හැකි ඉඩම් වශයෙන් හඳුනාගත් ලැයිස්තුවක් මා වෙත එවා ඇත. එම ලේඛණය මෙහි ඇමුණුම 02 මගින් ඔබ වෙත එවමි. එම ඉඩම්වලින් මේ වන විට ඔබගේ භාරයට ගෙන ඇති ඉඩම් ප්‍රමාණය ද මා වෙත දන්වා එවන්න. (ඇමුණුම 02 හි 04 කොටස සම්පූර්ණ කර) මේ වන විටත් එම ඉඩම් ඔබගේ භාරයට ගෙන නොමැති නම් අඩවි වන නිළධාරි සමඟ සම්බන්ධ වෙමින් එම ඉඩම්වල මායිම් හඳුනාගෙන ඔබගේ භාරයට ගැනීමට මැයි 31 දිනට ප්‍රථම අවසන් කරන්න.

04. ඉහත 03 I හා II යටතේ ඔබ භාරයට ගනු ලැබූ ඉඩම් සම්බන්ධයෙන් වර්තමාන ඉඩම් පරිහරණ තත්වය මෙහි ඇමුණුම 03 ආකෘතිය ප්‍රකාරව මා වෙත ඉදිරිපත් කල යුතු වේ. එසේම එම ඉඩම් කිසිදු සංවර්ධනයක් රහිත හිස් ඉඩම් සේ පවතී නම්, ඉඩම් පරිහරණ සැලසුම් නිලධාරි සමහ සම්බන්ධීකරණය වෙමින් එම ඉඩම්වල යෝග්‍ය පරිහරණ රටාව හඳුනාගෙන ඒ පිළිබඳව මෙහි ඇමුණුම 03 ආකෘතිය ප්‍රකාරව මා වෙත වාර්තා කල යුතුය. එවැනි ඉඩම් අනවසර අල්ලා ගැනීම්වලින් තොරව මතු සංවර්ධන කටයුතු සඳහා වෙන්කොට ආරක්ෂාකර තැබීම ඔබගේ ප්‍රමුඛ වගකීමක් බවද අවධාරණය කරමි.

05. රජයේ ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කරමින්, ඉඩම් ආර්ථික සම්පතක් ලෙස සංවර්ධන කාර්යය සඳහා ප්‍රශස්ථ වශයෙන් යොදා ගැනීම පිණිස මෙම කාර්යය සඳහා ප්‍රමුඛත්වය ලබා දී කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

**ජී.ඩී. කිරිති ගමගේ,**

ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත් :

| | |
|---|---|
| 01. ලේකම්, ඉඩම් අමාත්‍යාංශය | - කරු. දැ.ගැ.ස |
| 02. අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | - කරු. දැ.ගැ.ස |
| 03. සියළුම අන්තර් පළාත් ඉඩම් කොමසාරිස් /සහකාර ඉඩම් කොමසාරිස්වරු | - කරු. දැ.ගැ.ස |
| 04. සියළුම පළාත් ඉඩම් කොමසාරිස්වරු | - කරු. දැ.ගැ.ස |
| 05. ඉඩම් කොමසාරිස් I , II , III | - කරු. දැ.ගැ.ස. සහ අ.ක.ස. |

ඇමුණුම 02

## <u>වන සංරක්ෂක දෙපාර්තමේන්තුව විසින් හඳුනාගත් ඉඩම්</u>

| අනු අංකය | 01<br>දිස්ත්‍රික්කය | 02<br>ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | 03<br>හඳුනාගත් ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර) | 04<br>ප්‍රාදේශීය ලේකම් භාරයට ගත් ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර) |
|---|---|---|---|---|
| 01 | පුත්තලම | නවගත්තේගම | 312 | |
| | | මහවැව | | |
| | | ආරච්චිකට්ටුව | | |
| | | කල්පිටිය | | |
| | | හලාවත | | |
| 02 | කුරුණෑගල | ගිරිබාව | | |
| | | කුලියාපිටිය - බටහිර | | |
| | | පන්නල | | |
| | | ඉබ්බගමුව | | |
| | | පඩුවස්නුවර - නැගෙනහිර | | |
| 03 | මොනරාගල | තනමල්විල | 25009 | |
| | | මැදගම | | |
| | | මොණරාගල | | |
| | | මඩුල්ල | | |
| 04 | බදුල්ල | හල්දුම්මල | 3696 | |
| 05 | ගාල්ල | නාගොඩ | 3048 | |
| | | නියාගම | | |
| | | යක්කලමුල්ල | | |
| | | අක්මීමන | | |
| | | ඉමදූව | | |
| 06 | මාතර | මාතර කඩවත් සතර | 322 | |
| | | පස්ගොඩ | | |
| | | කිරින්ද පුහුල්වැල්ල | | |
| | | වැලිපිටිය | | |
| | | අකුරැස්ස | | |
| | | කඹුරුපිටිය | | |
| | | දික්වැල්ල | | |
| | | පිටබැද්දර | | |

| | | | | |
|---|---|---|---|---|
| 07 | හම්බන්තොට | හම්බන්තොට | 165 | |
| | | ලුනුගම්වෙහෙර | | |
| 08 | අනුරාධපුර | තලාව | 347 | |
| | | නාච්චදූව | | |
| | | නොච්චියාගම | | |
| | | තිරප්පනේ | | |
| | | කහටගස්දිගිලිය | | |
| | | හොරොව්පොතාන | | |
| | | ගලෙන්බිඳුනුවැව | | |
| | | මහවිලච්චිය | | |
| | | පලාගල | | |
| | | රඹෑව | | |
| | | ම.නු.ප | | |
| | | ඉපලෝගම | | |
| | | රාජාංගනය | | |
| | | කැකිරාව | | |
| | | මැදවච්චිය | | |
| | | පලුගස්වැව | | |
| | | ගල්නෑව | | |
| | | කැබිතිගොල්ලෑව | | |
| | | පදවිය | | |
| | | මිහින්තලේ | | |
| 09 | පොලොන්නරුව | මැදිරිගිරිය | 729 | |
| | | හිඟුරක්ගොඩ | | |
| | | ඇලහැර | | |
| | | ලංකාපුර | | |
| | | වැලිකන්ද | | |
| | | දිඹුලාගල | | |
| 10 | ත්‍රිකුණාමලය | ගොමරන්කඩවල | 2729 | |
| | | මොරවැව | | |
| 11 | අම්පාර | උහන | 12196 | |
| | | මහඔය | | |
| | | පදියතලාව | | |
| | | අම්පාර | | |
| 12 | මඩකලපුව | | 3880 | |